# රුහුණ විශ්වවිද්‍යාලය

## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

## ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (M.A.) උපාධි පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම 2018/2019

රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මඟින් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා අධ්‍යයන මණ්ඩලය යටතේ පවත්වාගෙන යනු ලබන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (M.A.) උපාධි පාඨමාලාවේ 2018/2019 කණ්ඩායම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>ලියාපදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම් :</u>**

I. ආර්ථික විද්‍යාව විෂය ක්ෂේත්‍රයෙන් අවම වශයෙන් අර්ස 30 සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම, හෝ

II. පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් පළපුරුද්දක් තිබීම

III. ඉහත I හෝ II ට සමකළ හැකි සහ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් සුදුසුකමක් තිබීම හෝ

IV. අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් පළපුරුද්දක් හෝ සුදුසුකම් සහිතව NVQ - 7 මට්ටම සමත්ව තිබීම.

V. පහත දැක්වෙන වෘත්තීය සුදුසුකම් සමඟ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්දක් තිබීම.

(a) CIMA සුදුසුකම් ලබා තිබීම,
(b) ව්‍යාපාර ගණකාධිකාරි පාඨමාලාව (Certificate Business Accountants of ICASL)
(c) HNDA (වසර 04ක)
(d) HNDC (වසර 04ක )
(e) ACCA සුදුසුකම් ලබා තිබීම,
(f) AAT ඉහලම සුදුසුකම් ලබා තිබීම,
(g) CMA ඉහලම සුදුසුකම් ලබා තිබීම,
(h) බැංකු හා මූල්‍ය ඩිප්ලෝමාව (Diploma in Banking & Finance (IBSL)

VI. මීට අමතරව විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් සුදුසුකම්.

**<u>පාඨමාලාවේ ස්වභාවය :</u>**

ඉගැන්වීම් මාධ්‍යය - සිංහල හෝ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් කැමති මාධ්‍යයකින් හැදෑරීම සඳහා ඉල්ලුම්පත් යොමු කළ හැකිය.

කාලසීමාව - අධ්‍යයන වර්ෂ එකක් හෙවත් සමාසික දෙකකි.

සම්පූර්ණ පාඨමාලා ගාස්තුව රු. 100,800.00 කි. ඉන් පළමු වාරිකය වන රු. 55,800.00 ක් ලියාපදිංචි වීමේදී ගෙවිය යුතු අතර දෙවන වාරිකය වන රු. 45,000.00 ක මුදල දෙවන සමාසිකය ආරම්භයට ප්‍රථම ගෙවා අවසන් කළ යුතු වේ.

**<u>ශිෂ්‍යත්ව අවස්ථා:</u>**

ආර්ථික විද්‍යා ශාස්ත්‍රපති පාඨමාලාවේ ඉංග්‍රීසි මාධ්‍ය අපේක්ෂකයින් අතුරින් තෝරාගනු ලබන තිදෙනෙකු හට රුහුණ විශ්වවිද්‍යාලය සහ නෝර්වේ Adger University අතර පවතින සන්ධාන ව්‍යාපෘතිය යටතේ නෝර්වේ Adger විශ්වවිද්‍යාලයෙන් වසරක ශිෂ්‍යත්වයක් පිරිනැමීමට කටයුතු යොදා ඇත.

**<u>අයදුම්පත් ලබාගැනීම :</u>**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.02.15 වේ. අයදුම්පත් ලබා ගැනීම සඳහා රු.1000/= ක මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවකින් යොමු අංක 322051900000013 දරණ රුහුණ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන රැස්කිරීමේ ගිණුමට බැරවන සේ ගෙවා ලබාගත් ලදුපතෙහි පිටුපස තම නම සහ ලිපිනය සමඟ ඉල්ලුම් කරනු ලබන පාඨමාලාව පැහැදිලිව සඳහන් කර ඉදිරිපත් කළ යුතුවේ. (මෙම යොමු අංකය රහිත ලදුපත් මගින් කරනු ලබන කවර හෝ ගෙවීමක් සඳහා රුහුණ විශ්වවිද්‍යාලය වගනොකියන බව කරුණාවෙන් සලකන්න.) අයදුම්පත පැමිණ ලබා ගන්නේ නම්, රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට සතියේ දිනයන්හි පැමිණ ලබාගත හැකිය. තැපැල් මඟින් අයදුම්පත් ලබා ගන්නේ නම්, නම සහ ලිපිනය ලියූ රු. 45/= ක් වටිනා මුද්දර ඇලවූ 9x4 ප්‍රමාණයේ ලියුම් කවරයක් සමඟ පෙර කී රු.1000/= ක මුදලක් ගෙවා ලබාගත් ලදුපත "ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර" යන ලිපිනයට 2019.02.05 දිනට පෙර එවිය යුතුය. ලිපිකවරයේ වම්පස ඉහළ ඉල්ලුම් කරනු ලබන පශ්චාද් උපාධි පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය.

මේ සඳහා වැඩි විස්තර 041-2222681/2 දිගුව 2160/2177 අමතා සතියේ වැඩ කරන දිනයන්හි කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැකිය. නියමිත දිනට පසුව අයදුම්පත් නිකුත් නොකරන අතර අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

අයදුම්පත් සම්පූර්ණ කර භාරදීම මාර්ගගත (Online) ක්‍රමයටද සිදුකළ හැකිය. (මේ සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ වෙබ් අඩවිය (www.fgs.ruh.ac.lk) බලන්න.)

ලේඛකාධිකාරි
රුහුණ විශ්වවිද්‍යාලය
2019.01.07